අරගලය සහ කාටූනයන් තුනක්: ඔබේ අදහස?
දින තුනකදී, සිළුමිණ පුවත්පත මඟින්, "අරගලයේ නායකයින්" සම්බන්ධයෙන් සඳහන් කරමින් කාටූනයන් තුනක් පළ කොට තිබුණේ පහත අන්දමිනි.
* ඉන් පළමු කාටූනය (අප්‍රේල් 23, 2023) දිවි තොර කරගත් පුද්ගලයෙකු සම්බන්ධයෙන් සඳහන් කරමින් පළ කොට තිබිණි. (දිවි තොර කරගැනීමක් සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් සලකමින් සංවේදීව වාර්තා කළ යුතු නොවන්නේ දැයි Ethics Eye මීන් පෙර ප්‍රශ්න කොට ඇත.)
* දෙවන කාටූනය (අප්‍රේල් 30, 2023), අරගලයේ නායකයන් පිළිබඳව සඳහන් කරමින් පළ කර තිබිණි.
* තුන්වෙනි කාටූනය (මැයි 14, 2023), අරගලයේ හිටපු නායකයන් ලෙඩවීම, මිය යෑම, නීතිවිරෝධී කටයුතු නිසා අත්අඩංගුවට පත් වීම, දිට්ඨ ධම්ම වේදනීය කර්ම පළ දීමක් ලෙසින් සඳහන් කරමින් පළ කර තිබිණි.
1) මෙම කාටූනයන් කුමන පදනමක් ඔස්සේ මෙම ප්‍රකාශයන් සිදු කරන්නේද? විශේෂයෙන්ම පළමු කාටූනය තුල අරගලය හා සම්බන්ධ සියදිවි නසාගත් අයෙකු සම්බන්ධයෙන් පලවන මෙම ප්‍රකාශය අසංවේදි නොවන්නේද? (මෙම සිදුවීම සම්බන්ධ පෙර කල පෝස්ටුවක් මෙතැනින්: https://www.facebook.com/ethicseye/photos/1926317934389921)
2) අරගලයේ නායකයින් ඉලක්ක කරමින් පළ වී ඇති මෙම කාටූනයන් සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

